## පළමුවන දේව ප්‍රකාශනය

ද්විතීය නීති සංග්‍රහය 30:10-14

ද්විතීය නීති සංග්‍රහය පොතෙන් ගත් කොටසකි.

**"දේව වචනය ඔබ වෙත ඇත. එය අනුසාර කරන්න."**

දෙවි සමිඳාණන් වහන්සේ ඔබ ගැන ද නැවත ප්‍රීති ප්‍රමෝද වන්නේ, මේ නීති සංග්‍රහයේ ලියා ඇති දෙවි සමිඳාණන් වහන්සේගේ ආඥා ද නීති හා නියෝග ද පිළිපදින පිණිස, ඔබ උන් වහන්සේගේ හඬට කීකරු වුණොත්, ඔබේ මුළු හෘදයෙන් සහ ඔබේ මුළු සිතින් උන් වහන්සේ වෙත හැරී ආවොත් පමණකි. "මා ඔබට අද නියම කරන මේ පණත දුෂ්කර එකක් වත්, ඉටු කරන්නට අපහසු එකක් වත් නොවේ. එය ඇත්තේ අහසෙහි නොවේ; එබැවින් එය අසා, ඉටු කරන පිණිස අප වෙත ගෙන එන්නට කවරෙක් අහසට නගින්නේ ද කියා කිසිවෙකුට කිව නොහැකි ය. එය ඇත්තේ මුහුදින් එතෙර ද නොවේ; එබැවින් එය අසා ඉටු කරන පිණිස අප වෙත ගෙන එන්නට කවරෙක් මුහුද තරණය කරන්නේ ද කියා කිසිවෙකුට කිව නොහැකි ය. එහෙත්, ඒ වචනය ඔබ ඉටු කරන පිණිස එය ඔබට ඉතා ළං ව, ඔබේ තොල් මත ද ඔබේ සිතෙහි ද ඇත්තේ ය."

දේව වචනය මෙසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## පිළිතුරු ගීය

ගීතාවලිය 69:13, 16, 29-30, 32-33, 35-36

පිළිතුර: දෙවිඳුන් සොයන්නෝ දිරිමත් වන්නෝ ය.

ගීය: එහෙත් සමිඳුනි, මාගේ අයැදුම ඔබට ය. අනේ දෙවිඳුනි! ඔබ රිසි වේලාවක මට පිළිතුරු දුන මැනව! ඔබේ අධික ප්‍රේමයෙන් ඔබ දුන් ගැළවීමේ පොරොන්දුව ඉටු කරන නිසා, මට උත්තර දුන මැනව! සමිඳුනි, ඔබේ තිර පෙම යහපත් බැවින් මට පිළිතුර දුන මැනව!.

ඔබේ ඉමහත් දයාව අනුව ඔබේ මුහුණ මා වෙත හැරෙව්ව මැනව! එහෙත්, මම පීඩා විඳිමින් වේදනාවෙන් සිටිමි. අනේ දෙවිඳුනි! මා සනසා, මා ගළවා ගත මැනව! එවිට මම ගී ගයා දෙවිඳුන් පසසන්නෙමි; තුති ගී ගයමින් මම එතුමන් බොහෝ සේ පසසන්නෙමි

පීඩිතයෝ මෙය දැක ප්‍රීති ප්‍රමෝද වන්නෝ ය; දෙවිඳුන් සොයා යන්නෝ දිරිමත් වන්නෝ ය. මන්ද, සමිඳාණෝ දිළිඳුන් හට සවන් දෙන සේක; හිරගත වී සිටින තම සෙනග අත් නොහරින සේක.

දෙවිඳාණෝ සියොන් කන්ද මුදාගෙන ජුදාගේ නගර ගොඩනගන සේක. එතුමන් සෙනග එහි වසමින් එය භුක්ති විඳින්නෝ ය. එතුමන්ගේ සේවක පෙළපත එය උරුම කරගන්නෝ ය. දෙවි නමට පෙම් කරන්නෝ එහි වාසය කරන්නෝ ය.

## දෙවන දේව ප්‍රකාශනය

කොලොස්සි 1:15-20

පාවුලු තුමන් විසින් කොලොස්සිවරුන් වෙත ලියන ලද හසුනෙන් කොටසකි.

**"මුළු විශ්වයම, උන් වහන්සේ කරණකොටගෙන ද උන් වහන්සේ උදෙසා ද මවන ලද්දේ ය."**

ක්‍රිස්තුන් වහන්සේ අදෘශ්‍යමාන දෙවියන් වහන්සේගේ දෘශ්‍යමාන ස්වරූපය ව, මුළු මැවිල්ලේ අගතැන් ගන්නා සේක. මක්නිසා ද සිංහාසන වේවා, ස්වාමිකම් වේවා, අධිපතිකම් වේවා, බලපරාක්‍රම වේවා, ස්වර්ගවල සහ පොළොවෙහිත් ඇති පෙනෙන්නා වූ දේවල් ද නොපෙනෙන්නා වූ දේවල් ද යන සියල්ල උන් වහන්සේ තුළ මවන ලද්දේ ය; සියලු දේ උන් වහන්සේ කරණකොටගෙන ද උන් වහන්සේ උදෙසා ද මවා තිබේ; උන් වහන්සේ සියල්ලට ම පළමුවෙන් සිටින සේක, සියල්ල

ද උන් වහන්සේ තුළ පවතින්නේ ය. උන් වහන්සේ සභාව නමැති ශරීරයේ හිස ය. එහි මූලාරම්භය ය. මරණයෙන් උත්ථාන වීමෙහි ප්‍රථමයාණෝ ය. මෙසේ උන් වහන්සේ සියල්ලෙහි අසමසම තැන දරන සේක. මන්ද, දේව කැමැත්ත අනුව, දේවත්වයේ පරිපූර්ණතාවය ක්‍රිස්තුන් වහන්සේ තුළ විය. උන් වහන්සේ කරණකොටගෙන මුළු විශ්වය ම තමන් හා සමඟි කරගැනීමට පියාණන් වහන්සේ සතුටු වූ බැවින්, කුරුසිය මත පුත්‍රයාණන්ගේ යාගික රුධිරය හේතු කොටගෙන සාමදනය ඇති කරමින්, උන් වහන්සේ කරණකොටගෙන සගලොවෙත් මෙලොවෙත් ඇති සියලු දේ සමඟි කළ සේක.

දේව වචනය මෙසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## සුපුවත් ජය නද

ජොහන් 10:27

ආලේලූයා! ආලේලූයා!
"මාගේ බැටළුවෝ මාගේ කටහඬ අසති. මම ද ඔවුන් අඳුනමි; ඔව්හු ද මා පසුපස්සේ එති" යි ස්වාමින් වහන්සේ වදාරන සේක. ආලේලූයා!

## ශුද්ධවූ සුවිශේෂය

ලූක් 10:25-37

ලූක් තුමගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

**"මාගේ අසල්වැසියා කවරෙක් ද?"**

එක්තරා විනයධරයෙක් නැඟිට, ජේසුස් වහන්සේ පරීක්ෂා කරමින් "ගුරුදේවයෙනි, සදතන ජීවනය හිමි කරගනු සඳහා මා කුමක් කටයුතු ද"යි ඇසී ය. උන් වහන්සේ ද ඔහුට පිළිතුරු දෙමින්, "ව්‍යවස්ථාවලියෙහි ලියා ඇත්තේ කිමෙක් ද? ඔබ එය තේරුම්ගන්නේ කෙසේ ද"යි ඇසූ සේක. ඔහු උත්තර දෙමින්, "නුඹේ මුළු හෘදයෙන් ද නුඹේ මුළු සිතින් ද නුඹේ මුළු වීර්යයෙන් ද නුඹේ මුළු බුද්ධියෙන් ද නුඹේ දෙවි වූ ස්වාමින් වහන්සේටත්, නුඹ නුඹට ප්‍රේම කරන්නාක් මෙන් නුඹේ අසල්වැසියාටත් ප්‍රේම කරන්න යනුයි" කී ය. උන් වහන්සේ, "ඔබේ උත්තරය හරි ය. එසේ කරන්න, එවිට ඔබ ජීවත් වන්නෙහි ය"යි ඔහුට වදළ සේක. එහෙත් ඔහු තමන් නිවැරදි බව දක්වන්ට කැමැති ව "මාගේ අසල්වැසියා කවරෙක් ද"යි ජේසුස් වහන්සේගෙන් ප්‍රශ්න කෙළේ ය. ජේසුස් වහන්සේ පිළිතුරු දෙමින් මෙසේ වදළ සේක: "එක් මිනිසෙක් ජෙරුසලමෙන් ජෙරිකෝව බලා යද්දී, සොර මුළකට අසුවිය; සොරු ඔහුගේ වස්ත්‍ර පැහැරගෙන, ඔහුට තළා පෙළා, ඔහු අඩ පණ කොට දමා යන්නට ගියහ. ඒ අතර එක් පූජකයෙක් අහම්බෙන් ඒ මග යනුයේ, ඔහු දැක පාරේ අනෙක් පැත්තෙන් ගියේ ය. එසේ ම ලෙවීයයෙක් ද, එතැනට පැමිණ ඔහු දැක පාරේ අනෙක් පැත්තෙන් ගියේ ය. එහෙත්, ඒ මඟින් ගමන්ගත් එක් සමාරිය ජාතික මිනිසෙක් ඔහු හුන් තැනට අවුත්, ඔහු දැක, අනුකම්පා උපදවා, ඔහු වෙතට ගොස්, තෙල් හා මිදියුස ගල්වා, තුවාළ බැඳ, තමාගේ ම මෘගයා පිට හිඳුවා, තානායමට ගෙන ගොස් ඔහු බලාගත්තේ ය. පසුවදා ඔහු රිදී කාසි දෙකක් ගෙන තානායම්කාරයාට දී, 'මොහු බලාගන්න; මෙයට වැඩියෙන් ඔබ වියදම් කරන යම් තරමක් ඇද්ද, නැවත ආ විට මම එය ඔබට ගෙවන්නෙමි'යි කී ය. ඉදින් සොරුන් අතට අසුවූ ඒ තැනැත්තාට මෙකී තිදෙනාගෙන් අසල්වැසියා වූයේ කවරෙක් ද කියා ඔබ සිතන්නෙහි ද? "ඔහුට දයාව දක්වූ තැනැත්තා ය"යි විනයධරයා කී ය. "ඔබත් ගොස් එසේ ම කරන්නැ"යි ජේසුස් වහන්සේ ඔහුට වදළ සේක.

සමිදාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.
ලබන ඉරුදින දේව ප්‍රකාශන සඳහා http://sinhalagospel.com/ වෙත පිවිසෙන්න.